## හෙළ දරුවනට සිප් නැණ බෙදන

# වික්ටෝරියානු සිංහල භාෂා පාසල

## එපිං හා රොක්ස්බර්ග් පාක්



වර්ෂ 1991 වසරේදී වික්ටෝරියානු භාෂා පාසලට අනුබද්ධිතව, කුඩා අංකුරයක් ලෙස ඇරඹුනු අප සිංහල භාෂා පාසල, අද අතු ඉති විහිදා ලූ විසල් රුකක් ලෙස නැගී සිටින්නේ එහි විසිතුන් වන උපන්දිනය සමරමිනි.

මෙල්බර්න්හි අප සිංහල භාෂා පාසල ආරම්භ කිරීමට පුරෝගාමී වූවන් අතර, මහත් කාර්යභාරයක් ඉටු කළ පැට්‍රික් දේවපුර හා සාරධර්ම අපේ දරු පරපුරට දායාද කිරීම අපගේ යුතුකම වන්නේය. සිංහල භාෂා පාසල අද උර දරන්නේ එම ප්‍රජා මෙහෙවරටයි.

"දෙමාපියන් ලෙස අප බලාපොරොත්තුව සිංහල භාෂාව සමඟම අපේ සාරධර්ම දරුවාට ලබාදීමයි. යහපත් පරිසරයක වැඩෙන දරුවා නොමඟ යෑමේ අවස්ථා අඩුයි. සිංහල පාසලෙන් කෙරෙන සේවය මම ඉතා අගය කරනවා."

චන්ද්‍රිකා විතාන මහත්මිය (මව - යෝමිත් මලවරආරච්චි - 7/8 ශ්‍රේණිය ආසබ මලවරආරච්චි - 3/4 ශ්‍රේණිය )

It is very important that my children learn Sinhala as they can communicate with our relatives who are in Sri Lanka."

**Mrs. Farooza Ibrahim (Mother of Ashkar Mohomed – Gr. 7/8 And Azeera Mohomed – Gr. 5/6)**

"සතියේ දින පහේම දරුවන්ට උදේට නැඟිටුවා ගන්නේ හරිම අමාරුවෙන්. ඒත් සෙනසුරාදාට කිසි කරදයක් නෑ. සිංහල ඉස-"කෝලේ යනවද කියලා අහපු ගමන්ම නැඟිටලා සූදානම් වෙනවා. සිංහල ඉස්කෝලේ යන්න දුව හරි ආසයි."

**නිලූපා කොළඹතන්ත්‍රි මහත්මිය හා අරුණ කොළඹතන්ත්‍රි (මව හා පියා - අමායා කොළඹතන්ත්‍රි - පහළ ප්‍රාථමිකය හා 1 ශ්‍රේණිය)**

"අපේ පන්තිය හරිම විනෝදජනකයි. අපි ඉගෙන ගන්නේ විවිධ ක්‍රියාකාරකම් හා ක්‍රීඩා මගිනුයි. ඒ නිසා ඉගෙන ගන්න දේ අපිට විෂයයක් ලෙස හදාරන්න මම බලාපොරොත්තු වෙනවා."

**කවීෂා දන්වත්ත ලියනගේ**
**7/8 ශ්‍රේණිය**

සිංහල භාෂා පාසලේදී දරුවෝ විෂය නිර්දේශයට (AusVELS) අනුව සවන්දීම , කථනයලිවීම හා කියවීම මෙන්ම ඊට සමගාමීව සිංහල සාහිත්‍යය, ලංකා ඉතිහාසය හා ශ්‍රී ලාංකික සංස්කෘතයි ඉගෙන ගනිති. සිංහල භාෂාවේ ව්‍යාකරණ දැනුම (Grammatical Knowledge) ලබන අතරම පන්ති කාමරයේ විවිධ ක්‍රියාකාරකම් මගින් දරුවෝ, ප්‍රායෝගික දැනුම (Practical Knowledge) අත්පත් කර ගනිති. ස්වයං ඉගෙනුම (Self study) මෙන්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්වල (Group Activity) දරුවන්ව නිරත කරවන ව්‍යාපෘති රැසකි. පර්යේෂණ මගින් දත්ත රැස් කිරීම, කණ්ඩායමක් වශයෙන් වැඩ කිරීම (Team Work) හා කාලය ඵලදායි ලෙස කළමනාකරණය පන්ති කාමරයේදී ප්‍රායෝගිකව ඉගෙනීම මගින් දරුවන්ව පාසලෙන් පසු වැඩිහිටි සමාජයට හැඩ ගැස්වීමක් ද සිදුවේ. එසේම දරුවෝ තම තමා විසින් ලියන ලද ලිපි හා නිර්මාණ ප්‍රජා පුවත්පත්වල (Community Newspapers) පළ කිරීමෙන් සංනිවේදන මාධ්‍ය :කදපපමබසඑහ ඒාස* භාවිතය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබති. සිංහල පරිගණක යතුරු පුවරුව භාවිතයට හුරු කරවීම තුළින් දියුණු වන තාක්ෂණයට දරුවාව යාවත්කාලීන (Updating IT knowledge) කිරීමක් ද කරවයි.

අධ්‍යාපනඥයින්ට අනුව භාෂා කිහිපයක් (Multilingual Skills) හැසිරවීමට ප්‍රගුණ කරන දරුවාගේ, ප්‍රජානන නිපුණතාව (Cognative skills) ඉතා ඉහළ ස්ථරයක පවතින බව ප්‍රකාශ වේ.

ඔස්ට්‍රේලියානු බහු සංස්කෘතික සමාජයේ ජීවත් වෙමින් ශ්‍රී ලාංකික භාෂා හා සංස්කෘතියට ආදරය කරන්නට ඉගෙන ගන්නා දරුවෝ, වෙනත් භාෂාවන් හා සංස්කෘතීන් (Inter Cultural Knowledge and Awarness) ගැනද පන්ති කාමරයේදී සාකච්ඡාවට බඳුන් කරති.

විෂය නිර්දේශයට සමගාමීව සෑම පාසල් වාරයකට වරක් පැවැත්වෙන සිංහල ශිෂ්‍ය සමිතිය තම භාෂා දස්කම් පෙන්වීමට පළමු වේදිකාව කර ගන්නා දරුවෝ දෙවසරකට වරක් පැවැත්වෙන විවිධ ප්‍රසංගය වර්ණවත් කිරීමට එම අත්දැකීම් උපයෝගී කර ගනිති.

"දෙගුරුන් විසින් තම
දරුවන්ට දෙන නොමඳ දන නම්
වියතුන් සබා මැද
ඉන්ට ඉදිරිව සිල්ප දෙනුමැයි"

\- **ලෝකෝපකාරය -**

ලෝකෝපකාරයෙන් කියවුණු දේ අද ප්‍රායෝගිකව අත්දකිමින් සබකෝලයකින් තොරව සභාවක් ඉදිරියේ පෙනී සිටීම, ඉදිරිපත් වීම, නායකත්වය දැරීම, ස්වයං ශික්ෂණය හා පෞරුෂ වර්ධනය ඇති කර ගනීමට මෙවැනි විෂය බාහිර ක්‍රියාකාරකම් මනා රුකුලකි.

එසේම සිංහල භාෂාව දෙවන භාෂාවක් ලෙස වී. සී. ඊ. විභාගය හැදෑරීමෙන් අමතර ලකුණු (Bonus Marks) උපයා ගැනීමේ අවස්ථාව ලැබීම සිංහල භාෂාව විෂයයක් ලෙස හැදෑරීමට දරුවන් උනන්දු කරවන තවත් වැදගත් කරුණකි. මෙහිදී ලැබෙන අමතර ලකුණු (Bonus Marks), දරුවාට විශ්වවිද්‍යාල පාඨමාලාව තෝරා ගැනීමට (ATAR) විශාල පිටිවහලක් වේ.

වීඩියෝ තාක්ෂණය උපයෝගී කරගෙන පැවැත්වෙන දුරස්ථ අධ්‍යාපන ක්‍රමය (Distance Education – Poly Communication) මගින් ඈත ප්‍රදේශවල වෙසෙන දරුවන්ට සිංහල භාෂාව ඉගෙන ගැනීමේ අවස්ථාව වික්ටෝරියානු භාෂා පාසල (VSL* මගින් සළසා තිබේ.

සිංහල භාෂා පාසල විසින් මේ වාරයේ පවත්වන්නට යෙදෙන්නා වූ විශේෂ වැඩසටහන් කිහිපයකි. පළමුවැන්න වී. සී ඊ. විභාගය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව (VCE Information vision) යි. සිංහල භාෂාව දෙවන භාෂාවක් ලෙස (LOTE) හැදෑරීමෙන් ලැබෙන වාසි, එහි අධ්‍යයන සැලසුම (Study Design) හා විභාගය සඳහා දරුවා කෙසේ සූදානම් විය යුතුද යන්නත් මෙහිදී සාකච්ඡාවට බඳුන් කිරීමට නියමිතය.

දෙවැන්න සිංහල භාෂා පාසලේ විවෘත දිනය (Open Day) යි. සිංහල භාෂාව ඉගෙනීමට කැමති දරු දැරියන් හා ඔවුන්ගේ දෙමාපියන්ට මෙය විශේෂ අවස්ථාවක් වනු ඇත. එදිනදී භාෂා පාසලේ දරු දැරියන්ගේ නිර්මාණ දැන ගැනීමට මෙන්ම දරු දැරියන් හා ගුරු මහත්ම මහත්මීන් හමුවී වඩා විස්තර දැන ගැනීමේ අවස්ථාව ද ලැබේ.

වික්ටෝරියානු භාෂා පාසල (Victorian School of Languages - VSL) යටතේ උතුරා මෙල්බර්න්හි පැවැත්වෙන සිංහල භාෂා මධ්‍යස්ථානයකි.

රොක්ස්බර්ග් පාක් මධ්‍යස්ථානය
Roxburgh College
Donald Cameron Drive
Roxburgh Park (3064)
Tel : 9930 8100 / 040 8508195
1 - 12 ශ්‍රේණිය දක්වා

එපිං මධ්‍යස්ථානය
Epping Secondary College (Junior Campus)
Mc donalds Road
Epping
Tel : 9401 2599
1 - 10 ශ්‍රේණිය දක්වා

සෙනසුරාදා පන්ති වේලාවන් පෙ.ව. 9.00 - ප.ව. 12.20 දක්වා
වැඩිදුර විමසීම් :

විපුලි ගුණසේකර මහත්මිය 0421311916
හිමාලි කරුණාසේන මහත්මිය 0409077420

## සුභාෂිතයෙන්...

විසුවත් දුදන සහ සුදනන් රැගෙන සරු
නැනවත් රජතුමෝ ඔවුනට දෙති ඉසුරු
විස යුත් ගොර උරග කටැ රැඳි මිනි මහරු
සලසත් රුවන් කිරුලග රුවනට සොඳුරු

ගැදි කවිය :
දුදන සහ විසුවත්
සරු සුදනන් රැගෙන
නැවත් රජතුමෝ
ඔව්නට ඉසුරු දෙති
විස යුත් ගොර උරග
කටැ රැඳි මහරු මිනි
සොඳුරු රුවන් කිරුලැ
අග රුවනට සලසත්

අදහස : දුදනන් අතර සිටියත් වැඩවත් සුදනන් තෝරා ගෙන, නැනවත් රජවරු ඔව්නට ඉහත් තනතුරු දෙති. (එය හරියට) නයින් ගේ කටෙහි ඇති වටිනා මැනික් ගෙන තම ඔටුන්නෙහි අග මැනික ලෙස යොදා ගැනීම වැනි ය.




රජකමට පත්වන කෙනෙකුට තමන්ට අවනත නැනවත් අතවැසි පිරිසක් අවශ්‍ය වේ. රජවරුන් නෑයන් කෙරෙහි සැළකිලිමත් නොවන්නේ ඔවින්ගෙන් තමන්ට නිසි බුහුමන් නොලැබෙන නිසා විය යුතුය. තමන්ගේ කම-නෑ කම නිසා ඔහු රජුට බුහුමන් කිරීමට නොසිතති. එවිට නොනෑයන් ඉදිරියේ රජු අසහනයට පත් විය හැකි ය.

මෙහි විස ගොර උරගයන් (නයින්) නම් දුදනෝ ය. උන්ගේ කට රැඳි මිනි නම් සුදනෝ ය. කට මිනි නයින්ගේ ඇගේ ම කොටසකි. දුදනෝත් සුදනෝත් දෙ වගයකි. එහෙයින් මේ කමකට නැති උපමාවක් ලෙස මට සිතේ.

ඉන්දියාවේත්, ලංකාවේත් කිවියන් හැර නයින් ගේ කට මිනි ගැන දන්නා කෙනෙක් නැත. මිනක් ඇති නයකුගේ ඉරනම කෙබඳු විය හැකි ද? අද සිටින නයින් අතර කට මිනි ඇති නය් නැත. පන පිටින් දෙව් ලොව යන අපට එහි හැබෑ බොරු සෙවීමට උවමනා නැත.

අපි වාරියෙන් ්සර වක්බැ රැ "ැරදචක්බැ* අහසින් යමු. එදා මිනිසුන් අහසින් ගියේ රිදියෙනි. රිදියෙන් අහසින් යන මිනිසුන් අදත් ටිබැට් රටේ සිටින බව ගිය සතියේ ලංකාවේ පලවූ පුවත් පතක වූ ලිපියක සඳහන් විය. ඒවාට කට ලන අය (මෝඩයෝ) අද නැත. කහ පැහැයට ඇති බිය නිසාය ඒ. උරග යනු පපුවෙන් ඇවිදින සතුන් සඳහා යෙදෙන හෙයින් පොලගාත් පිඹුරාත් උරගයෝ ය.




## පොත පත දෙසට හෙලන විමසුම් ඇස

# "සාහිත්‍ය සම්භාෂණ"

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන "සාහිත්‍ය සම්භාෂණ" එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන් සෑම මසකම අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.

අන්තර්ජාලයෙන් ඇසීමට
http://www.sbs.com.au/yourlanguage/sinhalese/